# How To Make a Complaint to Sri Lanka Medical Council

While the Sri Lanka Medical Council **(SLMC)** is vested with the mandate to initiate disciplinary inquiries against healthcare professionals registered with it, such inquiries may only be initiated if the procedural requirements stipulated in the **Medical Disciplinary (Procedure) Regulations 1990** have been duly satisfied.

As per regulation 3 of the above Regulations, no complaint or report against a practitioner shall be entertained unless such **complaint or report**:

a. Is preferred by means of a **written statement** addressed to the Registrar setting out the facts or matters alleged against the practitioner and

b. In case where such complaint alleges infamous conduct in any professional respect/ negligence / incapacity relating to professional duties, should be supported by **an affidavit** as to the facts or matters alleged in such complaint or report.

Provided however, that where such complaint or report is made by a person acting in a public capacity, the requirement for verifying affidavit is dispensed with.

The expression '**person acting in public capacity'** means the Vice Chancellor or the Registrar of any University established under the Universities Act, No. 16 of 1978 or the head of a Government Department or the Mayor of any Municipality or the Chairman of any Urban Council or Pradeshiya Sabha or the Registrar.

Registrar

Sri Lanka Medical Council

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කල යුතු ආකාරය.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව (SLMC) වෙත එහි ලියාපදිංචි වී ඇති වෛද්‍යවරුන්/වෘත්තිකයන්ට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කිරීමේ බලය එම සභාවට හිමි වුවද, එවැනි පරීක්ෂණ ආරම්භ කළ හැක්කේ 1990 වසරේ **වෛද්‍ය විනය (ක්‍රියා පටිපාටි) නියෝගයේ** නියමිත ක්‍රියා පටිපාටි අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ නම් පමණි.

ඉහත නියෝග රෙගුලාසියෙහි 2 (3) වන නියෝගය අනුව, කිසිදු වෛද්‍යවරයෙකුට එරෙහි පැමිණිල්ලක් හෝ වාර්තාවක් පහත සඳහන් කොන්දේසි සපුරාලන තෙක් සලකා බැලීමට නොගනී:

**a)** එම පැමිණිල්ල හෝ වාර්තාව, වෛද්‍යවරයාට එරෙහිව චෝදනා කරන කරුණු හෝ සිදුවීම් පැහැදිලිව සඳහන් කරමින් **ලිඛිත ප්‍රකාශයක්/පැමිණිල්ලක්** ලෙස **වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුය;** සහ

**b)** එකී ලිඛිත පැමිණිල්ල කිසියම් වෘත්තීය කරුණක් සම්බන්ධ අපකීර්තිමත් හැසිරීමක් හෝ වෘත්තීය යුතුකම්වලට සම්බන්ධ පැහැර හැරීමක් හෝ අයෝග්‍යවීමක් සම්බන්ධයෙන් වන විට, ලිඛිත පැමිණිල්ලේ නගා ඇති චෝදනාව හා ඊට අනුගත සිද්ධිය සනාථ කෙරෙන පැමිණිල්ලේ දිනයම දරණ **දිවුරුම් ප්‍රකාශයක්ද ලිඛිත පැමිණිල්ල සමඟ යොමු කල යුතුයි.**

එහෙත්, එම පැමිණිල්ල හෝ වාර්තාව **රාජ්‍ය නිලතලයෙන් ක්‍රියා කරන පුද්ගලයෙකු විසින්** ඉදිරිපත් කරනු ලැබේ නම්, දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත.

මෙහි "රාජ්‍ය නිලතලයෙන් ක්‍රියා කරන පුද්ගලයෙකු" යන්නෙන් අදහස් වන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත කර ඇති විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා හෝ රෙජිස්ට්‍රාර්වරයා, රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියා, මහ නගර සභාවක නගරාධිපතිවරයා, නාගරික සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා හෝ රෙජිස්ට්‍රාර්වරයා ය.

ලේඛකාධිකාරි
ශ්‍රී ලංකා වෛද්‍ය සභාව
**11.02.2026**